සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

**අවසාන වාර පරීක්ෂණය - 2021(2022 මාර්තු)**

| 10 ශ්‍රේණිය | ශිල්ප කලා | කාලය පැය 01යි. |
|---|---|---|

නම/ විභාග අංකය :- ..........................................................................................................

## I කොටස

(1) ශ්‍රී ලාංකික අපට සෞන්දර්ය අංග වලින් පරිපූර්ණ වූ ඉතිහාසයක් උරුම වී ඇත. එම ලාංකේය සිව්සැට කලාවේ ප්‍රභේද දෙක වන්නේ,

(1) ශ්‍රව්‍ය කලා, දෘශ්‍ය කලා (2) ජන කලා, දෘශ්‍ය කලා
(3) ජනකලා, විදග්ධ කලා (4) ශ්‍රව්‍ය කලා, විදග්ධ කලා

(2) පිය පුතු උරුමයෙන් පාරම්පරිකව පැවත එන නිර්මාණ ශිල්පීන් ඉතා අල්ප කර්මාන්තය මින් කුමක්ද?

(1) බතික් කර්මාන්තය (2) ලාක්ෂා කර්මාන්තය
(3) මැටි කර්මාන්තය (4) කොහු කර්මාන්තය

(3) ඉතා සුවිශේෂී වෙස් මුහුණක් පළඳින්නේ මින් කුමන අවස්ථාවේදී ද?

(1) දහ අට සන්නිය (2) දොළහ පාලිය
(3) සන්නි යකුම (4) මහා කෝල සන්නිය

(4) විවිධ පන් වර්ග භාවිතා කරමින් බොහෝ නිර්මාණ කරන අතර පැදුරු සඳහා ප්‍රසිද්ධ වන්නේ කවර ප්‍රදේශයද?

(1) දුම්බර (2) වත්තල (3) කළුතර (4) ගම්පොල





(5) විදේශිකයන්ගෙන් දායාද වූ කර්මාන්තය වන්නේ,

(1) පිත්තල (2) පන් (3) බීරළු (4) මැටි

(6) අතීතයේ ලෝකුරුවන් ලෙස හැඳින්වූයේ කුමන ශිල්පීන්ද?

(1) මැටි ශිල්පීන් (2) පතල් කරුවන්
(3) රන් කරුවන් (4) පිත්තල කාර්මිකයන්

(7) ජ්‍යාමිතික ඇඳීම ආකාර 02 ක් වන අතර ඉන් තල ජ්‍යාමිතියට අයත් නොවන්නේ මින් කුමන රූපයද?

(1)  (2)  (3)  (4) 

8) විහිත චතුරස්‍ර යුගලය භාවිතයෙන් ඇඳිය නොහැකි කෝණය

(1) $110^0$ (2) $75^0$ (3) $105^0$ (4) $145^0$


(9) ජාත්‍යන්තරව සම්මත වූ කඩදාසි වර්ගීකරණය අනුව $A_4$ කඩදාසියක දිග පළල මිලි මීටර් වලින් දැක්වෙන්නේ,

(1) 297 x 420 (2) 148 x 210 (3) 210 x 297 (4) 105 x 148

(10) B අක්ෂරයෙන් මිනිරන් වල මෘදු ගතිය දක්වන අතර B අක්ෂරයේ අගය වැඩි වන විට අඳින කඩදාසිය කුමන ස්වභාවය ගනීද?

(1) පිරිසිදුය (2) ඉරී යයි (3) පැහැදිලිය (4) අපිරිසිදු වේ

(11)




රූප සටහනේ ABC අක්ෂර වලින් දක්වා ඇති ඊතල අතර කෝණයන්ගේ පිළිවෙළ වන්නේ මින් කුමක්ද?

(1) සුළු කෝණය, ඍජු කෝණය, මහා කෝණය

(2) සුළු කෝණය, මහා කෝණය, ඍජු කෝණය

(3) පරාවර්ථ කෝණය, සුළු කෝණය, ඍජු කෝණය

(4) සරල කෝණය, ඍජු කෝණය, මහා කෝණය

(12) සම්මුඛ පාද සමාන හා සමාන්තර, විකර්ණ සමාන විකර්ණ සමච්ඡේදනය වන හා කෝණ ඍජු කෝණී වන චතුරස්‍රය කුමක්ද?

(1) ත්‍රපීසියම (2) රොම්බසය

(3) සමචතුරස්‍රය (4) ඍජුකෝණාස්‍රය

(13) අතීතයේ වර්ණ ලබා ගැනීමට මුතුන් මිත්තන් භාවිත කළේ පරිසර සම්පත් වේ. ඒවා අතර ගොකටු ගසේ කිරි වලින් සකස් කරගත් වර්ණය කුමක්ද?

(1) සුදු වර්ණය (2) කහ වර්ණය

(3) නිල් වර්ණය (4) රතු වර්ණය

(14) අච්චු මුද්‍රණ ක්‍රියාවලිය පහසු මුද්‍රණ ක්‍රමයක් වන අතර එහි වාසියක් නොවන්නේ මින් කුමක්ද?


(1) සමාන හැඩතල එකම ආකාරයට පවත්වාගෙන යා හැකි වීම.

(2) තමා කැමති මෝස්තර මුද්‍රා තබා ගත හැකි වීම.

(3) කාලය හා ශ්‍රමය වැඩිපුර වැය වීම.

(4) දැව හා ලිනෝලියම් මාධ්‍යයේ අච්චු නැවත නැවත භාවිතයට ගත හැකි වීම.

(15) සිදුරු තහඩු මෝස්තරයක් සඳහා ගත හැකි වන්නේ මින් කුමක්ද?

(1)  (2)  (3)  (4) 

(16) විශාල ප්‍රදේශ වර්ණ ගැන්වීමේදී භාවිතා කරන, වර්ණ සේදුම් සඳහා සුදුසු, කුඩා ප්‍රමාණයේ සිට විශාල ප්‍රමාණය දක්වා ඇති පින්සල් වර්ගය කුමක්ද?

(1) සියුම් නිමා පින්සල් (2) පැතැලි පින්සල්

(3) රවුම් පින්සල් (4) විශාල සේදුම් පින්සල්

(17) සත්ත්ව කෙඳි අතර සේද කෙඳි ලබා ගන්නේ කිනම් ක්‍රමයකටද?

(1) පටපනු කෝෂ මඟින් (2) ඔටුවාගේ ලෝම මඟින්

(3) කාශ්මීර එළු ලොම් මඟින් (4) ලාමාගේ ලෝම මඟින්

(18) ලෝකයේ නිපදවන රෙදි වලින් 75% ක් කපු රෙදි වන අතර ඉතා උසස් වර්ගයේ කපු වර්ගය කුමක්ද?

(1) චීන කපු (2) මිසර කපු

(3) පීලර් කපු (4) සී අයිලන්ඩ් කපු

(19) පැලෑටියේ කඳ කොටස් පොගවා කෙඳි ලබා ගන්නා දිලිසෙන හා ශක්තිමත් කෙඳි මිල අධිකය. ලිනන් රෙදි සඳහා යොදා ගන්නේ කුමන ශාකද?


(1) හණ (2) නියඳ (3) සිසල් (4) රැමී

(20) ලෝම ලබා ගන්නා බැටළු වර්ග 04කි. ඉන් උසස් කෙඳි ලබා ගන්නා බැටළු වර්ගය කුමක්ද?

(1) මස් බැටළුවා (2) දෙමුහුන් බැටළුවා

(3) මැරිනෝ බැටළුවා (4) දික් ලෝම් බැටළුවා

(21)



හරස්කඩ දික්කඩ

අන්වීක්ෂීය පරීක්ෂාවේදී හරස්කඩ හා දික්කඩ පෙනුම ඉහත ආකාරයට දිස්වන්නේ

(1) සාමාන්‍ය කපු (2) ඔප දමන ලද කපු


(3) ලෝම (4) සේද

(22) හැඩපෙති ආධාරයෙන් පටි වියීම අලංකාර නිර්මාණයකි. හැඩ පෙති සකසා ගැනීමේ මාධ්‍යයක් නොවන්නේ මින් කුමක්ද?

(1) තුනී ලෑලි (2) තුනී යකඩ තහඩු

(3) තුනී කඩදාසි (4) ප්ලාස්ටික් තහඩු

(23)



ඉහත රූප වලින් දක්වා ඇත්තේ බඳුන් පලස් දෙකක රූප සටහන් වේ. එහි දැක්වෙන වියමන් මෝස්තරය කුමක්ද?

(1) චාම් (2) ජටා (3) දික් දාර (4) හරස්දාර

(24) කෙඳි වල පිලිස්සීමේ පරීක්ෂාවේදී වහා ගිනි ගැනීම, හෙමින් පිළිස්සීම, කඩදාසි පිළිස්සෙන ගඳට සමාන ගඳක් ඇතිවන්නේ,

(1) කපු වලය (2) සේද වලය

(3) ලෝම කෙඳි වලය (4) ලිනන් වලය

(25) ඇලුමිනා සිලිකේට් හෙවත් මැටි නිර්මාණය වීමට අවශ්‍ය වන්නේ කුමන පාෂාණයේ ජීර්ණය වීමද?

(1) සිලිකා (2) ෆෙල්ඩ්ස්පාර් (3) ග්‍රොග් (4) ගිනිමැටි

(26) නිර්මාණය වූ ස්ථානයේම තැන්පත් වන පැහැයෙන් සුදු නම්‍යතාවය අඩු මැටි වර්ගය වන්නේ,

(1) ප්‍රාථමික මැටි (2) ද්විතීයික මැටි

(3) රතු මැටි (4) බෝල මැටි

(27) මහා පරිමාණ කර්මාන්ත වලදී වියළි මැටි වශයෙන් පදම් කිරීමේ ක්‍රමයක් නොවන්නේ,

(1) අර්දන් වෙයා (2) ස්ටෝන් වෙයා

(3) සෙරමික් (4) පෝසිලේන්

(28) ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රසිද්ධ බෝල මැටි නිධිය පිහිටා ඇත්තේ කොහිද?

(1) වේයන්ගොඩ (2) කළුතර (3) මහනුවර (4) දෙදියවල

(29) ඉතා අධික උෂ්ණත්වයකට ඔරොත්තු දිය හැකි මැටි වර්ගය කුමක්ද?

(1) කෙඔලින් මැටි (2) බෝල මැටි

(3) රතු මැටි (4) ගිනි මැටි

(30) පුළුස්සන ලද භාණ්ඩවල කුඩු හඳුන්වන නම කුමක්ද?

(1) සිලිකා වැලි (2) ග්‍රොග් (3) ක්වාට්ස් (4) ඩොලමයිට්

(31) මැටි තහඩුවේ මදක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හාරා මතු කරගන්නා කැටයම් හඳුන්වන්නේ,

(1) අර්ධ උන්නත කැටයම්

(2) අල්ප උන්නත කැටයම්

(3) අධි උන්නත කැටයම්

(4) ලෝහ කැටයම්

(32) මැටි දරණු එකිනෙක සම්බන්ධ කළ යුතු ක්‍රමය කුමක්ද?

(1) එකම හැඩයට දෙපස කපා ඇලවීම

(2) දරණු වල මැටි පාප්ප වලින් ඇඟිමේ කුරකින් පළුදු කර ඇලවීම

(3) වියළුන පසු ඇලවීම

(4) සිදුරු කර ඇලවීම

(33) අපතේ යන රෙදි කැබලි භාවිතා කර කොට්ට උරයක් මසා ගැනීමේදී එම කැබලි එකලස් කර මහන ක්‍රමය හඳුන්වන්නේ,

(1) කට්පීස් (2) ගැටපඬු (3) පැච්වර්ක් (4) ඇප්ලික්

(34) කතිර මැස්ම යොදා ගනිමින් බිත්ති සැරසිල්ලක් මැසීම සඳහා සුදුසු රෙදි වර්ගය වන්නේ,

(1) ඩෙනිම් (2) මස්ලින් (3) පොප්ලින් (4) අයිඩා

(35) සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණයේදී පෙන්ග්වින් පක්ෂියෙක් නිර්මාණය කිරීමේදී කකුල් සඳහා සුදුසු රූපය කුමක්ද?



(1) (2) (3) (4)

(36) සුරතල් බලු පැටියෙකු නිර්මාණය කර ගැනීම සඳහා සුදුසු රෙදි වර්ගය තෝරන්න.

(1) පොලියෙස්ටර් (2) ෆෙල්ට් (3) ලිනන් (4) සේද

(37) කඩදාසි මාධ්‍යයෙන් විසිතුරු නිර්මාණ කිරීමේදී මූලය වෙනුවට භාවිත කළ හැකි උපකරණය කුමක්ද?

(1) පැන්සල (2) කතුර (3) ටූත් පික් (4) කවකටුව

(38) පේපර් ක්විලින් නිර්මාණ සඳහා සුදුසු කඩදාසි වර්ගය මින් කුමක්ද?

(1) $A_4$ (2) ටිෂූ (3) තෙල් කඩදාසි (4) ඩිමයි

(39) උද්‍යාන අලංකරණ සඳහා සිමෙන්ති මිශ්‍රණය සැකසීමේදී සිමෙන්ති එකක් සඳහා මිශ්‍ර කළ යුතු වැලි ප්‍රමාණය වන්නේ,

(1) 2 - 3 දක්වා (2) 3 - 4 දක්වා

(3) 4 - 5 දක්වා (4) 5 - 6 දක්වා

(40) කඩදාසි පල්ප මාධ්‍යයෙන් උද්‍යාන අලංකරණ නිර්මාණයක් කිරීමේදී කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට යෙදිය යුතු වන්නේ,

(1) පොල්තෙල් හෝ ලින්සීඩ් ඔයිල්

(2) පොල්තෙල් හෝ කරාබු නැටි තෙල්

(3) කරාබු නැටි තෙල් හා ලින්සීඩ් ඔයිල්

(4) ලින්සීඩ් ඔයිල් හා කොහොඹ තෙල්

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2021(2022 මාර්තු)

| 10 ශ්‍රේණිය | ශිල්ප කලා | කාලය පැය 02යි. |
|---|---|---|

නම/ විභාග අංකය :- ..........................................................................................................................

## II කොටස

අනිවාර්ය ප්‍රශ්න අංක 01 සහ තෝරාගත් තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) රන්මිණිතැන්න මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසින් එම විදුහලේ සියවස් සැමරුම වෙනුවෙන් උත්සවයක් සංවිධානය කරනු ලබන අතර එයට ප්‍රදර්ශනයක්ද ඇතුලත්ය. ''දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් පරිසර හිතකාමී නිමැවුම්'' තේමා යටතේ භාණ්ඩ නිර්මාණය කෙරේ. ජයග්‍රහකයින් සඳහා ත්‍යාගද පිරිනැමේ.

i. පිවිසුම් දොරටුව අලංකාර කිරීමට යොදාගත හැකි අඩු වියදම් සැරසිලි මාධ්‍ය 2ක් නම් කරන්න.

ii. උත්සව ශාලාවේ පහන දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නව හැඩතල යොදාගෙන නිර්මාණය කිරීමට අදහස් කෙරේ. ඒ සඳහා සුදුසු පහනක ආකෘතියක් අඳින්න.

iii. වැටකෙයියා කොල ඇසුරින් සකස් සක හැකි බඳුන් පලසකට සුදුසු වියමන් රටාවක් අඳින්න.

iv. පැච්වර්ක් නිර්මාණද ප්‍රදර්ශනයට යොදාගැනීමට අදහස් කෙරේ. පැච්වර්ක් නිර්මාණයක රූප සටහනක් අඳින්න.

v. ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීමට යෝජිත මැටි මල් පෝච්චියක හැඩයක් අඳින්න.

vi. වූල් ආශ්‍රිත නිර්මාණ බොහෝය. ඉන් නිර්මාණ දෙකක නම් ලියන්න.

vii. උද්‍යාන අලංකාර කිරීම සඳහා විවිධ නිර්මාණ උද්‍යානය තුල ස්ථානගත කිරීමට අපේක්ෂා කෙරේ. උද්‍යාන අලංකරණ සඳහා වඩාත් සුදුසු වන්නේ කිනම් මාධ්‍යයක්ද? ඊට හේතුව ලියන්න.

viii. ප්‍රදර්ශන කුටි භාරව කටයුතු කරන අය සඳහා සුදුසු ලාංඡනයක් ඇඳ දක්වන්න.

ix. රිබන් එම්බ්‍රොයිඩර් නිර්මාණ සඳහා භාවිතා වන මැහුම් ක්‍රම කිහිපයකි. ඉන් මැහුම් ක්‍රම 2ක් ලියන්න.

x. ජයග්‍රාහකයින් සඳහා තෑගි ඇසිරීමට පත් භාවිතයෙන් සකසන ලද ජ්‍යාමිතික හැඩයෙන් යුතු බඳුන් යෝජනා වී ඇත. ඒ සඳහා සුදුසු හැඩතල 2ක් අඳින්න.

ලකුණු 20

(2) කාර්මික චිත්‍ර ඇඳීම සඳහා විවිධ ද්‍රව්‍ය හා උපකරණ භාවිතා කරයි.

i. ජ්‍යාමිතික කට්ටලය ලියා දක්වන්න.

ii. වෘත්තයක් ඇඳ ජ්‍යාය, විශ්කම්භය, කේන්ද්‍රික ඛණ්ඩය ඇඳ දක්වන්න.

iii. ජ්‍යාමිතික ඇඳීමේ ක්‍රම භාවිතා කරමින් 5cm දිග සරල රේඛාවක් සමාන කොටස් 6කට බෙදා දක්වන්න.

(3) රෙදි පිළි අලංකරණය සඳහා විවිධ ශිල්ප ක්‍රම භාවිතයට ගැනේ.

i. පාරිසරික සම්පත් ඇසුරින් වර්ණ සැකසීමට භාවිතා කරන අමුද්‍රව්‍ය 3ක් ලියන්න.

ii. ස්වාභාවික සායම් වර්තමානයේ භාවිතය ක්ෂය වීමට මූලික වී ඇති හේතු 3ක් නම් කරන්න.

iii. මූලික වර්ණයක් ඒ අසළම ඇති ද්විතීයික වර්ණයක් සමග මුසු වීමෙන් තෘතියික වර්ණ බිහිකරගත හැක. එම තෘතියික වර්ණාවලිය ලියා දක්වන්න.

(4) විජය කුමරුගේ ලංකාගමනයේදී කුවේණිය කපු කටිමින් සිටීම අප රට තුළ අතීතයේ සිට රෙදි පිළි නිෂ්පාදනය පැවති බවට සාක්ෂියක් වී ඇත.

i. රෙදි නිෂ්පාදනය සඳහා පෙහෙකම් කෙඳි යොදා ගනී. මෙම කෙඳි බෙදෙන ප්‍රධාන කොටස් 2 ලියා දක්වන්න.

ii. ලෝම කෙඳි ලබා ගන්නා සත්ත්ව වර්ග 5ක් නම් කරන්න.

iii. වියමන් රටා ප්‍රභේද කිහිපයකි. ඉන් චාම් වියමන හා ජටා වියමන ප්‍රස්තාරගත කරන්න.

(5) මානව ශිෂ්ටාචාරයේ ආරම්භයක් සමඟ පැවත එන කලාවක් ලෙස මැටි ශිල්පය හැඳින්විය හැකිය.

i. මැටිවල රසායනික නාමය ලියා දක්වන්න.

ii. මැටි ජීර්ණය සඳහා බලපාන ස්වාභාවික හේතු 3ක් ලියන්න.

iii. මැටි නිර්මාණය වීමේ ක්‍රියාවලිය අනුව බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කර ඉන් එක් කොටසක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(6) විවිධ විසිතුරු නිර්මාණ කිරීම අද ජනප්‍රිය ගෘහ කර්මාන්තයක් බවට පත් වී ඇත.

i. රිබන් එම්බ්‍රොයිඩර් සඳහා යොදාගනු ලබන රිබන් වර්ග 3ක් ලියා දක්වන්න.

ii. මැසීමේදී භාවිත වන විසිතුරු මැහුම් ක්‍රම 4ක් ලියා දක්වන්න.

iii. කුෂන් කවරයක් සඳහා සුදුසු පැච්වර්ක් මෝස්තරයක් ඇඳ එය නිර්මාණය කරගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(7) ස්වාභාවික පරිසර වින්දනය මඟින් ගිමන් නිවා ගැනීමට මිනිසා ගනු ලබන උත්සහයක ප්‍රතිඵලයකි උද්‍යාන අලංකරණ නිර්මාණ

I. මූර්ති ගොඩනැගීමේදී අනුගමනය කරනු ලබන ශිල්පීය ක්‍රම කිහිපයකි. ඉන් 2ක් ලියා දක්වන්න.

ii. උද්‍යාන මූර්ති නිර්මාණය සඳහා යොදාගනු ලබන මාධ්‍ය 4ක් සඳහන් කරන්න.

iii. උද්‍යාන මූර්තියක් ලෙස බිම් මලක් නිර්මාණය කර ගැනීමේ පියවර කෙටියෙන් විස්තර කර ලියා දක්වන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2021(2022 මාර්තු)

10 ශ්‍රේණිය

ශිල්ප කලා

පිළිතුරු පත්‍රය

## I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (11) | 1 | (21) | 2 | (31) | 1 |
| (2) | 2 | (12) | 4 | (22) | 3 | (32) | 2 |
| (3) | 4 | (13) | 2 | (23) | 1 | (33) | 3 |
| (4) | 1 | (14) | 3 | (24) | 4 | (34) | 4 |
| (5) | 3 | (15) | 1 | (25) | 2 | (35) | 4 |
| (6) | 4 | (16) | 2 | (26) | 1 | (36) | 2 |
| (7) | 2 | (17) | 1 | (27) | 3 | (37) | 3 |
| (8) | 1 | (18) | 4 | (28) | 4 | (38) | 1 |
| (9) | 3 | (19) | 1 | (29) | 4 | (39) | 1 |
| (10) | 4 | (20) | 3 | (30) | 2 | (40) | 3 |

## II කොටස

(1) I. කෙසෙල් පතුරු, ගෝනි, පිටපළු ලී, රෙදි, ශාකපත්‍ර, මල්

ii. ඇද ඇති නිර්මාණශීලී පහනක හැඩතලයක් සඳහා

iii. චාම්, ජටා, දික්දාර, හරස්දාර හෝ වෙනත් වියමන් රටාවක්

iv. පැච්වර්ක් වලට ගැලපෙන රූප සටහනක් සඳහා

v. ගැලපෙන හැඩතලයක් වෙනුවෙන් ලකුණු ලබා දෙන්න

vi. තොප්පි, මේස්, ළදරු, ඇඳුම, වෙනත් ඇඳුම්, ගෘහ අලංකරණ නිර්මාණ

vii. සිමෙන්ති මාධ්‍ය - කල් පැවැත්ම, පහසුව, සපයා ගැනීමේ පහසුව, ඉහල ආදායම් ලබා ගතහැකිවීම

viii. ඇඳ ඇති සුදුසු ලාංඡනයකට

ix. රිබන් මැස්ම, කෙලින් මැස්ම, ලේස්ඩේසි මැස්ම, නැටි මැස්ම, ලූප් මැස්ම

x. ඇඳ ඇති නිවැරදි ජ්‍යාමිතික හැඩයකට

ලකුණු. 2 x 10=20

(2) i. කෝදුව, විහිත චතුරස්‍ර යුගළය, කෝණමානය, කවකටුව, බෙදුම් කටුව

ii. නිවැරදි කොටස් නම් කිරීමට ලකුණු ලබා දෙන්න

iii. අඳින ලද නිර්මාණයට ලකුණු ලබා දෙන්න ලකුණු 2+3+5=10

(3) i. ගස්වල පොතු, පත්‍ර, කිරි, මැටි වර්ග, ශාක තෙල් වර්ග, සත්ත්ව තෙල් වර්ග

ii. වර්ණ සකසා ගැනීමට වැඩි කාලයක් ගත වීම
ශාකයන්හි මල්, ගෙඩි හට ගැනීම ඍතු අනුව සිදු වීම
සායම් නිෂ්පාදනය කාලයකට පමණක් සීමා වීම
සායම් කල් තබා ගැනීමේ ක්‍රමවේද නොතිබීම ආදී පිළිතුරු

iii. රතු දම්, නිල් දම්, රතු රඹ, කහ රඹ, කහ කොළ, නිල් කොළ

ලකුණු 2+3+5=10

(4) i. ස්වාභාවික කෙඳි, කෘතිම කෙඳි

ii. බැටළුවා, එළුවා, විකුණා, ලාමා, ඇල්ෆකා, ඔටුවා

iii. අඳින ලද වියමන් රටා මෝස්තරයට අනුව ලකුණු ලබා දෙන්න

ලකුණු 2+3+5=10

(5) i. ඇලුමිනා සිලිකේට්

ii. සූර්යතාපය, වර්ෂාව, විදුලි කෙටීම, ආර්ද්‍රතාවය, හිම පතනය, ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය

iii. ප්‍රාථමික මැටි, ද්විතියික මැටි (ලියන ලද විස්තරයට අනුව ලකුණු ලබා දෙන්න)

ලකුණු 2+3+5=10

(6) i. බේබි රිබන්, සැටින් රිබන්, ඕගන්ට් රිබන්, ෂේඩඩ් රිබන්

ii. දම්වැල් මැස්ම, සැටින් මැස්ම, කතිර මැස්ම, ලේසිඩේසි මැස්ම, බූලියන් මැස්ම,
ප්‍රංශගැට මැස්ම, හුරුළු කටු මැස්ම, නැටි මැස්ම

iii. අඳින ලද පැච්වර්ක් නිර්මාණයට හා ලියන ලද විස්තරයට ලකුණු ලබා දෙන්න.

ලකුණු 2+3+5=10

(7) i. පූර්ණ උන්නත, අර්ධ උන්නත, අල්ප උන්නත

ii. ලෝහ, කළුගල්, කිරි ගරුඬ, සිමෙන්ති, මැටි, දැව, ප්ලාස්ටර් ඔෆ් පැරිස්

iii. කරනු ලබන විස්තරය පියවර ක්‍රමයට ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

ලකුණු 2+3+5=10